**රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව - 2012**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 01 | සමාලෝචිත වර්ෂය සඳහා අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීමේ ක්‍රමයට අවසන් ගිණුම් ඉදිරිපත් කර නොතිබුණු අතර පෙර වර්ෂවල ගිණුම් තොරතුරු එසේම ඉදිරිපත් කර තිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අන්තර්ගත කළයුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අවසන් ගිණුම් තුළ අන්තර්ගත කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 | වෙළඳ ගිණුම තුළ තොග අගය පිරිවැයට පෙන්නුම් කර ශුද්ධ උපලබ්ධි අගය දක්වා කපාහල අලාභය අදාල කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස අන්තර්ගත කළයුතු වුවද එසේ සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ අගය පමණක් දක්වා තිබූ අතර මුදල් |

ගලායාම් හා ලැබීම් දක්වා නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 | මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා වන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 | සුදුසුකම් ලත් වත්කමක් සම්බන්ධයෙන් දරන ණය ගැණුම් පිරිවැය අනිවාර්යෙන්ම ප්‍රාග්ධනගත කළ යුතු අතර, වියදමක් සේ ලියාහැරීමේ පිළිවෙතක් අනුගමනය කරන ලද්දේ නම් 2012 ජනවාරි 01 දින සිට අතීතානුයෝගීව වෙනස්කළ යුතු වුවද සංස්ථාව එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 | සංස්ථාවේ මුල්‍ය වත්කම් සාධාරණ අගයට (Fair Value) මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර නොතිබුණි. |

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාවද්‍ය ගිණුම් සටහන් යෙදීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 109,913,212 කින් වැඩියෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ අනුව මුල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ මුල්‍ය ප්‍රතිඵලවල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපනය වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | සාවද්‍ය ගිණුම් සටහන | ලාභය වැඩියෙන්/ (අඩුවෙන්) දැක්වූ ප්‍රමාණය |
|---|---|---|
| | | රු. |
| (i) | උපචිත වියදම් ගිණුම්වල වටිනාකම පාසල් පොත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබීම. | 38,710,402 |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී පාසල් පෙළ පොත් සඳහා අයකරන ලද දඩ මුදල් වටිනාකම ගිණුම් ගත කර නොතිබීම. | 10,622,762 |

---

| | | |
|---|---|---|
| (iii) | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් සංස්ථාවට ලැබිය යුතු පාසල් පොත් ආදායම්වලින් දඩ මුදල් සඳහා ප්‍රතිපාදනය කර නොතිබීම | 14,854,472 |
| (iv) | ඉදිරි ගෙවීම් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගලපා නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් වැඩියෙන්ද වර්ෂයේ ලාභය වැඩියෙන්ද පෙන්වා තිබීම. | 500,301 |
| (v) | සමාලෝචිත වර්ෂයේ අවසන් තොග ඌනතාවය ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් ලාභය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබීම. | 77,459 |
| (vi) | විදේශ ගමන් වියදම් ගිණුම් ගතකර නොතිබීම | 1,526,192 |
| (vii) | පසුගිය වර්ෂයන්ට අදාල අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගතකර තිබීම | (753,395) |
| (viii) | ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් දායක හා අධිභාර වටිනාකම වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබීම | 4,091,410 |
| (ix) | පරිගණක මෘදුකාංග හා ලී බඩු උපකරණ ක්ෂය වටිනාකම අඩුවෙන් ගිණුම් ගතකර තිබීම | 322,602 |
| (x) | ගොඩනැගිලි හා මොටර් වාහන ක්ෂය වටිනාකම වැඩියෙන් ගිණුම් ගතකර තිබීම | (170,900) |
| (xi) | ඉඩ නොදෙන යෙදවුම් මත එකතු කළ අගය මත බදු වටිනාකම අඩුවෙන් ගිණුම් ගතකර තිබීම | 32,755,211 |
| (xii) | රක්ෂණ වන්දි ලැබීම් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම | 535,600 |
| (xiii) | වෙනත් විකුණුම් ඒකකවල අවසාන තොගය අධි ආගණනය කිරීම | 6,841,096 |
| | | ----------------- |
| | ලාභය වැඩියෙන් දැක්වීම | 109,913,212 |
| | | ========== |

(ආ) නියමිත දිනට පොත් මුද්‍රණය කර භාර දීමට නොහැකිවීමත් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම මත පාසල් පෙළ පොත් සඳහා සමාලෝචිත වර්ෂයේදී අයකරන ලද රු.44,500,053 ක් වූ දඩ මුදල් වටිනාකම ගිණුම් ගත නොකිරීම හේතුවෙන් සංචිත හා අතිරික්ත ගිණුම රු.33,877,291 ක් වැඩියෙන්ද, ණයගැතියන් රු.44,500,053 ක් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී දිගුකාලීන බැංකු ණය ගිණුමට හර කරන ලද රු.3,989,830 ක් ණයගැති ගිණුමට බැර කිරීම හේතුවෙන් සංස්ථාවේ ණයගැතියෝ රු.3,989,830 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.56,734,717 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2012 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ නිරවුල් නොකරන ලද අත්තිකාරම් වටිනාකම රු.2,297,183 ක් වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද ණයහිමි අත්තිකාරම් උපලේඛනය හා ගිණුම අතර රු.1,008,744 ක වෙනසක් පැවතුණි.

1.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති වටිනාකම රු.514,427,534 ක් වුවද, ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබුණේ රු.72,174,627 ක් වූ වෙළඳ ණයගැතියන්ගෙන් පමණි. ඉන් රු.28,671,423 ක්වූ ශේෂ පමණක් තහවුරු කර තිබුණු අතර ගිණුමේ ශේෂයන් හා තහවුරු කරන ලද ශේෂය අතර රු.15,358,043 ක් වූ වෙනසක් අනාවරණය වූයෙන් ගිණුමේ දක්වා තිබුණු ණයගැති ශේෂයන්හි නිවැරදිභාවය පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් ණය ගැතියන්ගෙන් රු.253,497,550 ක්ම අයවිය යුතුව තිබුණේ ප්‍රධාන ගනුදෙනුකරු වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ආ) රු. 10,319,375 ක ණයගැති බැර ශේෂ, ණය ගැති ශේෂයෙන් හිලව් කර ශුද්ධ ණය ගැතියන් ගිණුම් වල පෙන්වා තිබුණද ණය ගැති බැර ශේෂවල අවු.05 ඉක්මවා තිබූ ශේෂ පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ණයගැතියන්ගෙන් රු.100,252,464 ක් වර්ෂ 01 ක්ද, රු.79,523,552 ක් වර්ෂ 02ක්ද, රු.36,647,074 ක් වර්ෂ 05 ක් ද, ඉක්මවා හිඟ හිටව පැවතුණු අතර පසුගිය වර්ෂයන්ට අදාල ණය අයකිරීම අයහපත් මට්ටමක පැවැතිණි.

(ඈ) සංස්ථාව කිසිදු පදනමක් නොමැතිව අලෙවි නියෝජිතයෙකු බඳවා ගෙන ණය පදනම මත අභ්‍යාස පොත් අලෙවි කළද සංස්ථාව කිසිදු ගිවිසුමකට බැඳී නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ඔහුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.7,902,046 ක් වී තිබුණ අතර, 2013 ජුනි 30 දින වන විටද ණය අයවීම අයහපත් මට්ටමක පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මහනුවර අලෙවි මධ්‍යස්ථානයේ ණයගැති ශේෂය රු. 4,509,102 ක් වු අතර ඇපකරයන් රහිතව ලබා දී ඇති මෙම ණය වලින් රු. 3,560,108 ක ණය අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

(ඊ) 2006 සිට 2011 වර්ෂය දක්වා පාසල් පෙළ පොත් මුද්‍රණය වෙනුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ඉන්වොයිස් 15 ක් සඳහා ලැබිය යුතු රු.6,342,671 ක මුදල අයකරගෙන නොතිබුණි.

(උ) 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද වයඹ විශේෂ ව්‍යාපෘතියේ 2012 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති වටිනාකම රු.2,146,429 ක් වී තිබුණි. මෙම මුදලින් අලෙවි ප්‍රවර්ධන නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.645,245 ක් වු මුදල් අයකර ගැනීමට හා ඉතිරි වටිනාකම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු 2012 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| හර බදු | 18,454,806 | උපලේඛන, ලෙජර් ගිණුම් |
| යන්ත්‍ර අමතර කොටස් | 16,230,859 | යන්ත්‍ර පරිභෝජන වාර්තා |

### 1.2.6 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 9 (ii)ඡේදය | විදේශ ගමන් දීමනා ඉල්ලුම් කිරීමේදී එයට සම්බන්ධ අනුමැතිය, දීමනා ගණනය කිරීමට පදනම් වන ගුවන් ගමන් විස්තර ඉදිරිපත් කළයුතු වුවද, එම විස්තර ඉදිරිපත් නොකර සංස්ථාවේ උපසභාපතිට සාමාන්‍යාධිකාරිට හා ක්‍රීඩා තරඟ සඳහා සහභාගීවුවන්ට එකතුව රු.2,520,026 ක විදේශ ගමන් දීමනා ගෙවා තිබුණි. |

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ

| | |
|---|---|
| (i) 8.3.4 වගන්තිය | සංස්ථාවේ සභාපතිවරයාගේ දුරකථන ගාස්තු වෙනුවෙන් සීමාව ඉක්මවා රු.329,450 ක් ගෙවීම් කර තිබුණි. |
| (ii) 8.3.9 වගන්තිය | අමාත්‍යවරයාට අයත් ජංගම දුරකථන බිල්පත් නිරවුල් කිරීම සඳහා සංස්ථාව රු.356,894 ක් ගෙවා තිබුණි. |
| (iii) 8.3 වගන්තිය | සංස්ථාවේ සභාපතිවරයාගේ නවාතැන් ගාස්තු වශයෙන් එකතුව රු.424,000 ක් 2012 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. |
| (iv) 8.3.8 වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලබා 2012 වර්ෂයේදී රු.1,050,000 ක් පරිත්‍යාග වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය | අමතර කොටස් සඳහා කිසිදු වගකීම් සහතිකයක් ලබා නොතිබුණු අතර එක් යන්ත්‍රයක් හෝ සම්පූර්ණ අළුත්වැඩියාවක් කර එහි සාර්ථකත්වය මත ඇගයීම් කිරීමට කටයුතු නොකර මෑන් රෝලන්ඩ්(Man Roland) යන්ත්‍රය සඳහා මිලදී ගනු ලැබූ වටිනාකම රු.8,201,080 ක් වූ අමතර කොටස් වලින් රු.759,989 ක් වටිනා අමතර කොටස් පමණක් සවිකර අනෙකුත් සම්පූර්ණ තොගයම ගබඩාවේ තිබියදී යන්ත්‍රය සාර්ථකව ක්‍රියාත්මක වන බවට තාක්ෂණික වාර්තාවක් ලබාගෙන අනෙකුත් යන්ත්‍ර සඳහාද අමතර කොටස් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.140,567,143 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී බදු පූර්ව ශුද්ධ ලාභය රු.133,688,336 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.6,878,808 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්තයන් ඉකුත් වර්ෂයට අදාල අනුරූප අගයන් සහිතව පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | 2012 | | 2011 | |
| | රු.(000) | (%) | රු.(000) | (%) |
| විකුණුම් | 1,219,131 | | 1,188,807 | |
| විකුණුම් පිරිවැය | 763,953 | | 792,849 | |
| දළ ලාභය | 455,177 | 37.3 | 395,958 | 33.3 |
| අදායම් බදු | 52,258 | | 56,688 | |
| ශුද්ධ ලාභය (බදු වලට පසු ) | 88,309 | 7.2 | 77,000 | 6.4 |

2.3 ණය උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළදී ලබාගත් කෙටිකාලීන ණයවල වටිනාකම රු.481,219,473 ක් වූ අතර ඉන් රු.296,586,575 ක් දෙසැම්බර් 31 දිනවන විටත් පියවා නොතිබුණි. නියමිත දිනට ණය නොගෙවීම නිසා ගෙවීමට සිදු වූ අමතර පොලිය ඇතුළුව රු.41,085,847 ක් සමාලෝචිත වර්ෂයේදී කෙටිකාලීන ණයපොලී ලෙස ගෙවා තිබුණි.

2.4 බැංකු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් බැංකු ගිණුම් 03 ක් පවත්වා ගෙන යනු ලබන අතර , මහජන බැංකුවේ (ජාත්‍යන්තර ශාඛාව) ගිණුම 2012 වර්ෂය තුළ නොකඩවා බැංකු අයිරාවක් පැවැති අතර එම බැංකු අයිරාව වෙනුවෙන් වර්ෂය තුළදී රු.6,276,304 ක පොලියක් ගෙවා තිබුණි.

(ආ) කෙටිකාලීන බැංකු ණය ලබාගැනීමේ වර්ධනය නිසාත් දිගින් දිගටම බැංකු ගිණුම් අයිරා තත්ත්වයක් පැවැතීම නිසාත් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 47 ක මූල්‍ය පිරිවැයෙහි විශාල වර්ධනයක් ඇති වී තිබුණි.

## 2.5 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත විදේශ ගමන් වියදම් රු.2,000,000 ක් වුවද, එම සීමාව ඉක්මවා වර්ෂය තුළදී විදේශ ගමන් වියදම් වෙනුවෙන් රු.4,258,282 ක් වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ දුරකථන ගාස්තු ලෙස රු.1,791,285 ක් වැයකර තිබුණු අතර, ඉන් සියයට 43 ක් වූ රු.767,434 ක් ගෙවා තිබුණේ සංස්ථාවේ සභාපතිවරයා හා ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ජංගම දුරකථන බිල්පත් පියවීම සඳහාය.

## 2.6 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පහත සඳහන් අනුපාතයන් සම්මත අනුපාත මට්ටම්වලට ළඟාවී නොතිබුණි. ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේ මුළු ජංගම වත්කම් වටිනාකමින් සියයට 89 ක ප්‍රමාණයක් අන්තර්ගත වී තිබුණේ ණයගැතියන් හා ද්‍රවශීලතාවයෙන් අඩු අවසන් තොගයෙනි. එසේම පාරිතෝෂිත වෙන්කිරීම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 110 ක් වෙනුවෙන් ආයෝජනයක් සිදු කර නොතිබුණි.

| ද්‍රවශීල අනුපාතය | සම්මත අනුපාත | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | 1.44:1 | 1.28:1 | 1.19:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:1 | 0.91:1 | 0.84:1 | 0.91:1 |

තොග විකුණුම් බවට පත්වන වාර ගණන පසුගිය වර්ෂයට වඩා අඩු වී තිබුණි. එමගින් තොගවල සාපේක්ෂ වශයෙන් ඉහළ ආයෝජනයක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. එලෙසම ආයතනය තුළ තොග තබා ගැනීමේ පිරිවැය ඉහළයාමේ අයහපත් තත්ත්වයක්ද නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| කාර්යක්ෂමතා අනුපාත | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 2.56 | 3.72 | 4.40 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 ආදායම

පාසැල් පොත් ආදායම, අභ්‍යාස පොත් ආදායම හා අනෙකුත් ආදායම් ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 51 කින්ද, රු.මිලියන 48 කින් හා රු.මිලියන 9 කින් වැඩි වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේ ආදායමට වඩා පිළියවෙලින් සියයට 8 කින්, සියයට 29 කින් හා සියයට 29 කින් වැඩි වී තිබුණි. වානිජ මුද්‍රණ ආදායම ඉකුත් වර්ෂයේ අදායමට වඩා රු.මිලියන 27 කින් හෙවත් සියයට 10 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

#### 3.1.2 නිෂ්පාදනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පාසැල් පොත් පිටපත් ඒකක 2,910,000 කින් නිෂ්පාදනය අඩුවී තිබුණි. එසේම වානිජ මුද්‍රණ සංඛ්‍යාවද 130 කින් අඩු වී තිබුණි. අභ්‍යාස පොත් පිටපත් සඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී 2,409,000 කින් හෙවත් සියයට 18 කින් වැඩි වී තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණය සඳහා ලැබී තිබුණු පාසල් පෙළ පොත් වර්ග සියයට 30 කින්ද, පිටපත් සංඛ්‍යාව සියයට 1.5 කින්ද අඩු වී තිබුණි. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 43 ක් හා සියයට 4.3 ක් වී තිබුණි.

(ආ) නියමිත දිනට පොත් මුද්‍රණය කර භාරදීමට නොහැකිවීමත් , නියමිත පිරවිතරයන්ට අනුකූල නොවීමත් මත 2011/2012 සහ 2012/2013 පාසල් පොත් ඇණවුම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.53,959,198 ක් වූ දඩ මුදල් ගෙවා තිබුණි.

(ඇ) Letter Press අංශයේ ස්ථාපිත එච්.බී -03 යන්ත්‍රය 2011 වර්ෂයේ සිට 2012 ජූලි මාසය දක්වා අඛන්ඩව ක්‍රියාවිරහිතව පැවතුණද එය අලුත්වැඩියා කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා සංස්ථාවේ Letter Press Binding සහ Litho අංශවල යන්ත්‍ර 15 ක් ඌණ උපයෝජිතව පැවතීම හේතුවෙන් අහිමි වූ නිෂ්පාදන ඒකක 82,141,292 ක් විය.

(ඉ) බැංකු අයිරාවලට හා කෙටිකාලීන ණය ගැණුම්වලට අධික පොලියක් ගෙවමින් සිටියදී අමතර කොටස් වැඩිපුර මිලදී ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ එසේ ගබඩා කර තිබූ අමතර කොටස්වල වටිනාකම රු.50,050,009 ක් විය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ප්‍රකාශන අංශය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.2,500,000 ක ආදායමක් ඉපයීමට ඇස්තමේන්තු කර තිබුණත් රැස්කරගෙන තිබුණේ රු.306,971 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ පාඩුව රු.284,006 ක් වි තිබුණි.

3.4 දෘශ්‍ය අක්‍රමිකතා

යන්ත්‍ර අමතර කොටස් මිලදී ගැනීම සඳහා රු.31,727,140 ක් වැය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන්ම සභාපතිවරයාගේ මැදිහත්වීමෙන් ව්‍යාජ ආයතනයක් පිහිටුවා එමගින් මිලදී ගැනීම සිදු කර තිබුණි.

(ආ) මෙම ගනුදෙනු සඳහාම පෞද්ගලික බැංකුවක ආරම්භ කර තිබූ ජංගම ගිණුමෙන් සංස්ථාවේ සභාපතිවරයා ඍජුවම රු .12,500,000 ක ගනුදෙනු කර තිබීම සහ රු.8,932,000 ක් වටිනා සමහර ගනුදෙනුවලට සභාපතිවරයා සම්බන්ධ වී තිබුණි.

(ඇ) මිලදී ගෙන තිබුණු අමතර කොටස්වලින් රු.75,959 ක් වටිනා අමතර කොටස් පමණක් ආනයනය කළ බවට විගණනයේදී සනාථ වූ අතර සැපයූ බව කියන අනෙකුත් අමතර කොටස් පිළිබඳව විස්තර කිසිවක් විගණනය වෙත ලබා දීමට අපොහොසත් විය.

(ඈ) ප්‍රසම්පාදනයට අදාල චීනයේ නිෂ්පාදිත බව සඳහන් කරන අමතර කොටස්වල මිලට වඩා අඩුමිලට නියම අමතර කොටස් (Genuine Parts) වෙළඳ පොලේ පැවතීම හා අමතර කොටස් නියැදියක එසේ අඩුමිලේ එකතුව රු.2,960,730 ක් විය.

(ඉ) අමතර කොටස් මිලදී ගැනීම සඳහා සැපයුම්කාර ආයතනයේ ලිපි ශීර්ෂ භාවිතා කොට සාවද්‍ය මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත රු.4, 667,900 ක් ගෙවා තිබුණි.

(ඊ) ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොතිබියදී කාර්ය සාධන සුරක්ෂණ ඇප වශයෙන් රු.2, 150,000 ක් වටිනා චෙක්පත් තුනක් ලබාදී තිබීම සහ එම චෙක්පත් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් බැංකු ගත නොකර ආයතනයේ රඳවා ගෙන තිබුණි.

3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි සිට ජූලි දක්වා සංස්ථාවේ යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවැති කාලය අයවැය ගත පැය ගණනට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. එය සියයට 24 සිට සියයට 79 දක්වා පරාසයක වී තිබුණු අතර මුළු නිශ්ක්‍රිය කාලයෙන් සියයට 79 ක් වැඩ නොමැතිවීම, සියයට 11 ක් යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම, සියයට 8 ක් යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිවීම එයට හේතු වී තිබුණි.

(ආ) ප්‍රමාණවත් වැඩ නොමැතිවීම හේතුවෙන් ලිතෝ හා බයින්ඩින් අංශවල මැෂින් 4ක් මුළු කාලයම නිශ්ක්‍රීයව පැවැතී තිබුණි.

(ඇ) සැලසුමකින් තොරව නිෂ්පාදනය කිරීමත් බෙදාහැරීමත් සහ අලෙවි කිරීමේ සැලසුම් දුර්වල වීමත් නිෂ්පාදනය සහ අලෙවි අංශ අතර මනා සම්බන්ධතාවයක් නොවීමත් හේතුවෙන් වටිනාකම රු.3,205,208 ක් වූ G.S.M 58 කඩදාසියේ නිෂ්පාදිත තොගයක් වර්ෂ ගණනාවක

සිට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ සංස්ථාවේ ගබඩාව තුළ සහ සංසරාජ මාවත ගබඩාව තුළ පැවතුණි.

(ඇ) ප්‍රකාශන විශාල තොගයක් දූවිලි බැඳී දූර්වර්ණ වෙමින් සංසරාජ මාවත අලෙවිසැලේ ගබඩාව තුළ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර අලෙවියට නුසුදුසු තත්ත්වයට පත්වීමට පෙර මෙම තොගය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් අලාභය අවම කරගැනීමට හා ගබඩාවේ ඉඩකඩ නිසිපරිදි ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා මිලදී ගෙන තිබූ රු.30,532,890 ක් වටිනා අමතර කොටස්වලින් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් අළුත්වැඩියාව සඳහා රු.26,260,390 ක් වටිනා අමතර කොටස් යොදාගෙන නොතිබුණි.

3.6 හඳුනා ගන්නා ලද පාඩු

2010 වර්ෂයේදී ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී සිදු වී තිබුණු රු.223,545 ක් වූ මුදල් ඌනතාවය හා රු.222,205 ක් වූ තොග ඌනතාවය අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගමට වෙනත් අයවිය යුතු මුදල් යටතේ දක්වා තිබුණි.

3.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සේවකයින් 12 දෙනෙකු ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට මුදාහැර තිබුණු අතර, සේවකයින්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරියෙකු සහතික කර නොතිබීයදී, වැටුප් වශයෙන් රු.2,390,151 ක් හා අතිකාල දීමනා වශයෙන් රු.680,310 ක් වශයෙන් එකතුව රු.3,070,461 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් කාලය අවසන්ව තිබූ සේවකයකු සේවය දීර්ඝ කරන ලද පත්වීම් ලිපිය භාරගෙන නොතිබියදී සහ සේවයට වාර්තා කිරීම පිළිබඳ පැමිණීමේ වාර්තා සංස්ථාවට ඉදිරිපත්ව නොතිබියදී අමාත්‍යාංශයට මුදාහැර ඇති සේවකයකුට වැටුප් වශයෙන් රු.278,464 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

(ඇ) මු.රෙ 268 ට පටහැනිව, අමාත්‍යාංශ සේවයට මුදාහැර ඇති සේවකයකුට වැටුප් අත්තිකාරම් වශයෙන් රු.50,000 ක්ද, වැටුප් වශයෙන් රු.38,875 ක්ද සභාපතිවරයා සහ සභාපතිවරයාගේ රියදුරු භාරගෙන තිබුණි.

3.8 වාහන උපයෝජනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නිල වාහන වෙනුවෙන් අනුමත සීමාව ඉක්මවා සංස්ථාවේ නිලධාරීන් රු.804,086 ක් වූ ඉන්ධන භාවිතා කර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 වගන්තියට පටහැනිව සංස්ථාවේ සභාපතිවරයාගේ පරිහරණය සඳහා වාහන 2 ක් යොදාගෙන තිබුණි.

(ඇ) 2002 ඔක්තෝම්බර් 11 දිනැති අංක MPDI/MPRD / වාහන දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අත්‍යාවශ්‍ය වාහන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා එකතු කළ අගය මත බද්ද (වැට්) රහිතව රු.40,000 ක සීමාවකට යටත්ව වාහන බදු කුලියට ලබාගැනීමට හැකිවුවද, සංස්ථාව ලබාගත් වාහන 3ක් සඳහා මාසයකට රු.48,000 බැගින් ගෙවා තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව වාහන ලොග් පොත් නිසිපරිදි යාවත්කාලීන කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ වාහන දෛනික ධාවන සටහන්වල ඇතුළත් කළයුතු තොරතුරු නිසිපරිදි සඳහන් කර නොතිබුණි.

(උ) සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා තරඟකාරී මිල කැඳවීම් සිදුකර අඩුම මිල තෝරාගැනීමක් සිදු නොකර සංස්ථාවට මෝටර් රථයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------

4.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාවේ 2009- 2013 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාල සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත් සංස්ථාව ඉලක්ක ගත නිෂ්පාදන ප්‍රමාණයන් හා වටිනාකම් පමණක් දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමේ හැකියාව හීන වී තිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

සංස්ථාවේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමත කර තිබුණේ 2012 ජුලි 05 දිනදීය. විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් මත මිලදීගැනීම් සිදුකර නොතිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම ඉක්ම වූ අමතර කොටස් මිලදීගැනීම් වටිනාකම රු.51,203,102 ක් වූයෙන් ප්‍රසම්පාදන සැලැස්ම ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.4 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත හා තථ්‍ය අගයන් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන දුර්වලතා

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයා වෙත වරින්වර දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) අත්තිකාරම් ගෙවීම්

(ඈ) අයවැය පාලනය

(ඉ) ප්‍රසම්පාදනය

(ඊ) වාහන පාලනය